05

# සුරූ හුරුව

සිසිර දිසානායක

හුරූ හඬක්!
වයලීන - වෙලෝ හඬ මුසුවක්.
ස්ටකාටෝ අළු පහරින් පොපියන වයලීනයක්.
පිසිකාටෝ ඇඟිලි තුඩින් ඊට ගැඹුරක් එක් කරන වෙලෝ තත් හඬක්.

යන්න ආව ගමන අමතක වෙලා ඉබේට ම. "මවුන්ට් වේවර්ලි" කඩමණ්ඩිය දිගේ දෙපා නැගුණේ ඒ ආත්මීය හඬ ගලා එන දිහාවට.

සුදු ජාතික පියෙක් සහ පුතෙක්. දණිස ළඟ නූල් ඇදුණ පරණ ඩෙනිම් කලිසම උඩින් වැටුණ සැහැල්ලු කපු කමිසය සුදු පුතාගේ දඟකාරකම තවත් වැඩි කරනවා. යෞවනයේ එළිපත්තේ නැටැවෙන අළුව වේගවත්. ඩෙනිම් තුන් කාලෙ කොට කලිසමට නො ගැළපෙන ටී ෂර්ට් එක සුදු පියාගේ වියපත් රූපයට තරුණ බවක් එක් කරන්න ලොකු උත්සාහයක. අව් කණ්නාඩි කුට්ටමත්, පන් කොළ තොප්පියත් පියාව කැලිප්සෝ වාදකයෙකුට අන්දනවා. නිස්කාන්සුවේ තත් අතර රඟනා ඇඟිලි තුඩු අගින්





මැවුණෙ අළුවට නටන්න කදිම පරිසරයක්. වාතලය හැඟුම්බරයි. වයලීන මිහිරට චෙලෝ රස භාව එක් වෙලා.

මේ ඕස්ට්‍රේලියාවේ විශාල නගර නම් අනන්තවත් ඇති. ඒත් "මවුන්ට් වේවර්ලි" ප්‍රදේශයේ මේ කඩමණ්ඩිය කුඩා වුණත් ලංකාවේ ගම් පළාත්වල තියෙන මධ්‍යම පන්තියේ කඩමණ්ඩියකට හුරුයි. පදික වේදිකාව කෙළවර වවලා තියෙන මේපල් ගස් පෙළ අලුත් දළුවලින් පිරිලා. ඒ එන වසන්තය වෙනුවෙන්. පහුගිය ගිම්හානයේ තමන් අත හැරලා සුළඟේ ගිය රතු ම රතු පාට මේපල් කොළ ගැන මේ ගස්වලට වගක් නෑ වගේ. අද ඉරිදා පොළ. ඒ හන්දා සෙනඟ හරියට. තල්දූවේ පොළ මතක් වෙනවා. ඒත් ඒ තරමටම කලබල නෑ මේ මණ්ඩිය.

පදික වේදිකාවේ කොනක තියෙන වයලීන බහාලුම් කොපුවට විටින් විට වැටෙන ඩොලර් කාසිවලට නම් තාලයක් නෑ. සමහර වෙලාවට ඒවාට උඩින් වැටෙන ඩොලර් නෝට්ටුත් නැතිවා නෙවෙයි. දෙපය කැන්දාගෙන ගිය හිත අද්දර මොකක්දෝ දුකක්... ඇස් කෙවෙණි තෙත් වෙලා වගෙයි. සුදු පිය පුතු බොඳවෙලා යනවා ඒ කඳුළේ.

හුරූ සර පෙළක්!

වයලීනය වයන ස්වර සංගතිවල තියෙන්නේ හරිම සුපුරුදු බවක්. සවන් පත් අතරින් රිංගාගෙන හද පත්ලට ම කිඳා බසින ළෙන්ගතු බවක්. හදවත හිත හැඟුම්බර කරවනවා.

"සංගීතය විශ්ව භාෂාවක්!"

කඳුළෙන් බොඳවෙලා ගිය සුදු පියාගේ ඡායාව අරා මතුවෙන තාත්තා කියනවා. තාත්තා අතේ චෙලෝවක්! ඒක වෙන්නෙ කොහොමද? තාත්තා වාදනය කළේ වයලීනය. තාත්තා සංගීත ගුරුවරයෙක් වුණාට චෙලෝවක් ගෙදර අහලකට ගේන්න තාත්තලා අම්මලාට වත්කමක් තිබුණෙ නෑ. ගමේ ඉස්කෝලෙ ළමයින්ට සංගීතය උගන්නපු තාත්තාට පරණ වයලීනයක් නම් තිබුණා. සමහර දාට තාත්තා වයලීනය පුහුණු වෙනවා. ඒ රෑට, රෑට.